# ධම්මපදය

## පුප්ඵ වර්ගය (14 ගාථාව)

**14.** ගාථාව

"තේසං සම්පන්නසීලානං - අප්පමාදවිහාරිනං,
සම්මදඤ්ඤා විමුත්තානං - මාරෝ මග්ගං න වින්දති"

**පදගතාර්ථය**

| | | |
|---|---|---|
| **සම්පන්නසීලානං** | - | පිරිපුන් සිල් ඇති |
| **අප්පමාද විහාරිනං** | - | අප්‍රමාදවිහරණ ඇති |
| **සම්මදඤ්ඤා විමුත්තානං** | - | මොනවට දැන මිදුනා වූ |
| **තේසං** | - | ඒ මහාක්ෂීණාශ්‍රවයන්ගේ |
| **මග්ගං** | - | මාර්ගය |
| **මාරෝ** | - | මාර තෙමේ |
| **න වින්දති** | - | නො දනියි |

**භාවාර්ථය**

සීලගුණයෙන් යුක්ත වූ අප්‍රමාදවිහාරී වූ චතුරාර්යයසත්‍යය දැන දුකින් මිදුනා වූ උතුමන් ගිය මග මාරයා නො දැනී.

**නිදන කථාව**

ඉසිගිලි කන්ද පාමුල පිහිටි කලුගල් තලාවෙක අප්‍රමාදවිහරණයෙන් යුක්ත ව වැඩහුන් ගෝධික තෙරණුවෝ, මහත් වූ වීර්යයෙන් යුතු ව දුරු කළ ආත්මාලය ඇති ව භාවනා කළහ. එයින් ගෝධික තෙරුන් වහන්සේට ලැබුණේ කෙලෙස් යටපත් වීමෙන් සාමයික-චේතෝවිමුත්තියක් පමණකි. මුළුමනින් ම කෙලෙස් සිඳී යාමෙක් සිදු නො වීය.

තමාව මැඩගෙන සිටි එක්තරා රෝගයක් හේතු කොට, ගෝධික තෙරුන්ගේ ධ්‍යාන පිරිහී ගියේ ය. එහෙත් එයින් පසුබට නො වූ තෙරුන් වහන්සේ නැවත නැවතත් ධ්‍යානය උපදවා ගත්ත ද ඒ සෑම වරෙක ම ධ්‍යානය පිරිහුනේ ය.

සත්වන වර ද ධ්‍යානය උපදවා ගෙන "මම සයවරක් ම ධ්‍යානයෙන් පිරිහුණෙමි. පිරිහුණු ධ්‍යාන ඇත්තහුගේ ගතිය, හෙවත් මත්තෙහි ලබන ආත්මභාවය මේ ය යි නියම කරනු බැරි ය, දැන් ලබා තිබෙන මෙම ධ්‍යානයෙනුත් පිරිහී ගියහොත් එය නම් මහත් හානියෙකි, නපුරු සිතුවිලි උපදවමින් ජීවත් වීමට වඩා මියයාම හොඳ ය. මේ ධ්‍යානයෙන් පිරිහෙන්නට මත්තෙන් මියයමි' යි සිතා දැළිපිහිය අතට ගෙන 'බෙල්ල කපා ගනිමි' යි ඇඳෙහි වැතිරගත්හ. එවිට මාර තෙමේ තෙරුන් වහන්සේගේ අදහස දැන 'මේ මහණ බෙල්ල කපාගැනීමට දැළිපිහියක් ගෙන ඇඳෙහි වැතිර ගත්තේ ය. බෙල්ල කපාගැනීමට සිතන්නේ ජීවිතය පිළිබඳ ව අපේක්ෂාවක් නැතිව ය. එබඳු බොහෝදෙනෙක් මරණයට පෙර විදසුන් වඩා රහත් වෙති. මෙය වළක්වන්නට මා කුමක් කියූවත් එය පිළි නො ගනියි. බුදුන් ලවා ම මෙය වළක්වන්නෙමි'යි අන් වෙසක් ගෙන බුදුරජාණන් වහන්සේ වෙත ගොස් ගාථා කියමින් මෙ කරුණ සැළකළේ ය.

ඒ ක්ෂණයෙහි දි ගෝධික තෙරණුවෝ, දැළිපිහියෙන් ගෙල කපා ගත්හ. බුදුරජාණන් වහන්සේ 'මෙතෙමේ මාරයා' යි දැන "මාරය! නුවණැත්තෝ මෙසේ ද කෙරෙති. ජීවිතය අපේක්ෂා නො කරති. ගෝධික තෙමේ මුල් සහිත වූ තෘෂ්ණාව උපුටා දමා පිරිනිවියේ'යි වදරා භික්ෂූන් කැටිව ගෝධික තෙරුන් වැඩහුන් තැනට වැඩි සේක.

එවේලෙහි වසවත් මාර තෙමේ ගෝධික තෙරුන්ගේ ප්‍රතිසන්ධි-විඥානය කොහි පිහිටියේ ද'යි සොයනුයේ දැක ගත නො හී නැවත කොලු වෙසක් ගෙන බේලුවපණ්ඩුවීණාවක් ගෙන බුදුරජාණන් වහන්සේ වෙත ගොස් "උඩ, යට, සරස, සිවුදිග, අනුදිග ගෝධික තෙරුන් ගිය තැන සොයා ගත නො හැකි වීමි. ඒ තෙරුන් කොහි උපන්නේද"යි විචාළ කල්හි බුදුරජාණන් වහන්සේ "ප්‍රඥාවන්ත වූ ධ්‍යාන වඩන්නා වූ ධ්‍යානයෙහි නිතර ඇලී සිටියා වූ ජීවිතාලය බැහැර දමා දිවා-රෑ

පිළිවෙතෙහි යෙදී සිටි ගෝධික තෙමේ මරසෙන් දිනා නැවත ඉපැත්මට නො එන්නේ මුල් සහිත වූ තෘෂ්ණාව උදුරා පිරිනිවියේ" යි වදළ කල්හි එයින් නො සතුටු වූ මාර තෙමේ ද අතුරුදහන් විය.

නැවත බුදුරජාණන් වහන්සේ "පාපිය! නුඹට ගෝධික තෙරුන්ගේ උප්පත්තිය සොයනු බැරි ය. නුඹ තබා නුඹ වැනි මාරයන් දහසකටවත් එය දකින්නට නො හැක්කේ ය"යි වදරා "**තේසං සම්පන්නසීලානං**" යන ගාථාව වදළ සේක.

ධර්මදේශනාව අවසානයෙහි බොහෝදෙනා සෝවාන් ඵලාදියට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩසහිත විය.

**ආත්මෝපදේශය** - ඥානයෙන් යුත් ගුණය ජීවිතයේ අලඞ්කාරය යි.

සාධු ! සාධු !! සාධු !!!

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(මැදින් 2552)**

<u>**සම්පාදක:**</u> පොල්ගස්ඕවිට සමථ-විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

<u>**පිටු සැකසීම:**</u> පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

<u>**ධර්මදානය:**</u> පින්වත් ආර්. ඩී. දයාසීලි උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

- *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**